# UK EXPOSURE VISIT

## LIVERPOOL – UNITED KINDOM

## Led by British Council – (11th march to 13th 2019)

**R.M.C.P.K. Rathnayaka**

**Assistant Director of Education – Career Guidance**

**Sri Lanka Education Administration Service 111**

**Co-curricular Guidance and Counseling Branch**

**Ministry of Education**

## හැඳින්වීම

අධ්‍යාපනය හා වැඩ ලෝකය අතර පරතරය අවම කිරීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. ඒ සඳහා පාසල් සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශ ක්‍රමවේදයක් සකස් කිරීම අවශ්‍ය වේ. නිසි මාර්ගෝපදේශය සැපයීම, අනාගත වැඩ ලෝකය සඳහා සිසුන් සූදානම් කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මේ පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික අධ්‍යාපන කොමිසම සහ බ්‍රිතාන්‍ය කවුන්සිලය එක්ව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ නව ප්‍රතිපත්තියක් සම්පාදනය කරමින් පවතී.

## වැඩසටහන සඳහා තෝරාගත් ආකාරය

ජාතික අධ්‍යාපන කොමිසමෙහි පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා කමිටුවෙහි පාර්ශව කරුවකු ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ. ඒ අනුව එහි සාමාජිකයෙකු ලෙස මා කටයුතු කරමින් සිටිමි. මෙම කාර්යය වඩාත් ඵලදායී කර ගැනීමේ අරමුණෙන් බ්‍රිතාන්‍ය කවුන්සිලය සහ **CAREERS CONNECT –UK** ආයතනය සමඟ එක්ව එක්සත් රාජධානියේ ජාතික වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව අදාළ කමිටු සාමාජිකයින් ජාත්‍යන්තර මට්ටමේ දැනුවත් කිරීම සඳහා මෙම **UK EXPOSURE VISIT** වැඩසටහන සංවිධානය කරනු ලැබීය. පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රතිපත්ති යෝජනා සැලසුම් කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස බ්‍රිතාන්‍ය කවුන්සිලය මඟින් ඒ සඳහා සහභාගී වීමට මා වෙත ආරාධනා කරන ලදී.

## වැඩසටහන පිළිබඳ සාරාංශය

එක්සත් රාජධානියේ ලිවර්පූල් නගරය ආශ්‍රිතව මෙම සංචාරය දියත් කරන ලදී. එම නගරය ආශ්‍රිත පාසල් සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන සඳහා, ජාතික, කලාප හා ප්‍රාදේශීය මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ සේවා සපයන ආයතනයන් වන **Career Connect - UK** විසින් මෙය සංවිධානය කර තිබිනි.

මෙහිදී පහත සඳහන් පාසල්, තාක්ෂණික විද්‍යාල හා පෞද්ගලික ආයතන වෙත නිරීක්ෂණ චාරිකාව ක්‍රියාත්මක කරන ලදී.

1. Liverpool Life Sciences University Technical College
2. Liverpool College
3. Notre Dame Catholic College
4. The Academy Of st Nicholas
5. Signature Living Management Company LTD.
6. City of Liver Pool College

පළමු හා දෙවන දෙදින පාසල් 04ක වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන පිළිබඳව අධ්‍යයනය කරන ලදී. එම පාසල්වල විදුහල්පතිවරුන් සහ වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ කටයුතු කරනු ලබන ගුරුවරුන් සමඟ සාකච්ඡා පැවැත්විනි. එක් එක් පාසල් විසින් ජාතික වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රතිපත්තියට සහ එමඟින් හඳුන්වා දී ඇති මිනුම් දඬුවලට (Benchmarks) අනුකූලව මෙම පාසල් සඳහා අනන්‍ය වූ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

එසේ ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය මාර්පෙදේශ වැඩසටහන් මඟින් ඔවුන් ලඟා කරගනු ලබන්නේ ජාතික මාර්ගෝපදේශ පද්ධතියට අදාළ කුමන මිනුම් දඬුව ද යන්න (Benchmarks) පිළිබඳව ඔවුන්ට පැහැදිළි අවබෝධයක් ඇත.

පොදුවේ ගත් කළ සෑම පාසලකම 8 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා මෙම වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කරනු දැකිය හැකි විය.

මෙම පාසල්වල විෂය භාර ගුරුවරුන් සහ සිසුන් සමඟ ද සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබිණි. වෙනත් විෂයන් උගන්වන ගුරුවරුන්ගේ අදහස්වලට අනුව, ඒ ඒ විෂයන් ඉගැන්වීම් කාර්යය තුලදීම සිසුවාට එම විෂයන් මඟින් යා හැකි වෘත්තීය මං පෙත් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ලබා දීම සිදු වේ. සෑම විෂයක් සමඟම වෘත්තීය මාර්ගෝපදේශය ද සම්මිශ්‍රිතව ලබා දෙනු ලබයි. ඒ ඒ විෂයන් මගින් ලද හැකි උසස් අධ්‍යාපන සහ වෘත්තීය අවස්ථා පිළිබඳව සිසුන් නිරන්තරයෙන් දැනුවත් කරනු ලබයි.

පාසලේ විවිධ අංශ නිරීක්ෂණයේ දී ද මෙය දැකිය හැකි විය. එක් එක් විෂයන් මඟින් යා හැකි වෘත්තීය අවස්ථා සහ එම විෂයන් ඔස්සේ වෘත්තීය සාර්ථකත්වය ලැබූ පුද්ගලයන් පිළිබඳව විස්තර ඇතුළත් පුවරු, පෝස්ටර්, බැනර් පාසලේ විවිධ ස්ථානවල ප්‍රදර්ශනය කර තිබෙනු දැකිය හැකි විය.

සිසුන් තුළ ද තමා හදාරනු ලබන විෂය ධාරාවට අදාළ වැඩසටහන් , අධ්‍යාපන අවස්ථා පිළිබඳව සහ වෘත්තීය අවස්ථාවන් පිළිබඳව පැහැදිළි අවබෝධයක් සහ තම අධ්‍යාපනික තීරණයන් පිළිබඳව දැඩි විශ්වාසවන්ත භාවයක් පවතින බව ඔවුන් සමඟ කරන ලද සාකච්ඡා වලදී පැහැදිළි විය.

සෑම විටම සත්‍ය ජීවන අත්දැකීම් හා සමීප කරමින් විෂයන් පිළිබඳව හා වෘත්තීන් පිළිබඳව දැනුම ලබා දීමට කටයුතු කරන බව නිරීක්ෂණය විය. එමෙන්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය සමඟ සමීප කිරීමට උත්සහ දැරීම ද සිදු වේ. දේශීය ව්‍යවසායකයන්, විවිධ වෘත්තීය පුහුණු ආයතන සහ උසස් අධ්‍යාපනය සමග ඒකාබද්ධව කටයුතු කරමින් පාසල් මඟින් ම වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම , විශ්ව විද්‍යාල සඳහා අයදුම් කරවීම, විකල්ප අධ්‍යාපන අවස්ථා ලබා දීම, වැනි වැඩසටහන් සිසුන් සඳහා සම්පාදනය කර ඇත.

සෑම විෂයක් තුළින්ම වැඩ ලෝකය පිළිබඳ අවබෝධයක් ලබා දේ. එක් එක් සිසුවා සඳහා වෘත්තීය මාර්ගෝපදේශය ලබා දීම සඳහා රජය මඟින් මුදලක් වෙන් කරනු ලබයි. 11 ශ්‍රේණියට පිවිසීමට පෙර එක් වරක් සහ 13 ශ්‍රේණියට පිවිසිමට පෙර එක් වරක් හෝ සිසුන් වෘත්තීය මාර්ගෝපදේශයට යොමු විය යුතුය.

තාක්ෂණික විද්‍යාලයන් තුළින් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම විධිමත්ව ලබා දෙන අතර සේවා යෝජකයන් සමග එක්ව පුහුණුවට අවස්ථාව සලසා සලසා දේ. නවීන පහසුකම්වලින් සමන්විත ප්‍රායෝගික පුහුණු පරිසරයක් සිසුන් වෙත ලබා දී ඇත. විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ද විශේෂ වෘත්තීය පුහුණු අවස්ථාවන් ද සකස් කර ඇත.

**එක්සත් රාජධානියේ ජාතික වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන සම්බන්ධයෙන් අනාවරණය වූ විශේෂිත කරුණු -**

1. සෑම පාසලකටම ජාතික වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ගත්, පාසල් වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවතීම.

2. විදුහල්පති, වෘත්තීය මාර්ගෝපදේශ ගුරුවරයා ඇතුළු කණ්ඩායම් මඟින් එම වැඩසටහන ක්‍රියාවට නැංවීම.

3. 11 ශ්‍රේණියට සහ 13 ශ්‍රේණියට පිවිසීමට පෙර එක් වරක් බැගින් සිසුවෙකු සිය පාසල් කාලය තුළ අවම වශයෙන් දෙවරක්වත් වෘත්තීය මාර්ගෝපදේශයට යොමු වීම සහතික වීම.

4. දැන්වීම් පුවරු, පෝස්ටර් බැනර් මගින් විෂයන්ට අදාළ වෘත්තීය මංපෙත්, වෘත්තීන්, විවිධ විෂයන් අනුව වෘත්තීමය විශිෂ්ඨතාවයන්ට පත්වූ පුද්ගලයන් පිළිබඳව තොරතුරු එක් එක් විෂයන්ට අදාළ අංශයන්හි සහ පාසලේ පොදු ස්ථානයන්හි ප්‍රදර්ශනය කිරීම

5. එක් එක් විෂයන්ට අනන්‍ය වූ වෘත්තීය ක්ෂේත්‍රයන්, වෘත්තීය මංපෙත්, උසස් අධ්‍යාපන අවස්ථා සම්බන්ධයෙන් විෂය භාර ගුරුවරුන් විසින් නිරන්තරයෙන් සිසුන් දැනුවත් කිරීම

6. තෝරාගත් විෂය ධාරාවන්ට අදාළ උසස් අධ්‍යාපන සහ අනාගත වෘත්තීය ක්ෂේත්‍රයන් පිළිබඳව සිසුන් තුළ ප්‍රමාණවත් අවබෝධයක් සහ විශ්වාසයක් පැවතීම

7. 8 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

8. සිසුන්ට වෘත්තීය අභ්‍යාසය ලබා දීමේදී දෙමාපියන් දැනුවත් කිරීම සහ තීරණ ගැනීම සඳහා දෙමාපිය සහය ලබා ගැනීම.

9. වැඩ ලෝකය සහ ශාස්ත්‍රීය අධ්‍යාපනය අතර පරතරය අවම කරලීම සඳහා සෑම විටම උත්සහ දැරීම.

10. බාහිර වෘත්තීය ආයතන උසස් අධ්‍යාපනය සමඟ ඒකාබද්ධ වෙමින් කටයුතු කිරීම සහ සිසුන් යොමු කිරීම.

11. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් සම්පාදනය කර තිබීම.

12. අනාගත වෘත්තියට ගැලපෙන ලෙස ක්‍රියාකාරකම් පාදකව අධ්‍යාපන කටයුතු කිරීමට සිසුන්ට අවස්ථාව සලසා දීම.

13 පාසල් අධ්‍යාපනයෙන් පසු අවශ්‍ය වන වෘත්තීය උපදේශනය පාසල තුළදීම ලබා දීමට කටයුතු කිරීම.

උදාහරණ ලෙස

- සම්මුඛ පරීක්ෂණ කුසලතා
- විශ්ව විද්‍යාල සහා ඉල්ලුම් කිරීම පිළිබව සහ අයදුම්පත් සම්පූර්ණ කිරීම.
- පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනය සැලසුම් කිරීම.
- වෘත්තීය කළමනාකරණය

14. වෘත්තීය තොරතුරු සහිත වෙබ් අඩවි සඳහා සිසුන් වෙත නොමිලේ අන්තර්ජාල පහසුකම් ලබා දීම.

15. සෑම සිසුවෙකුටම මනෝවිද්‍යාත්මක තක්සේරු කරණයකට ලක් කිරීම.

## ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා

1. පාසල් පාදක වෘත්තීය මාගෝ්පදේශ ප්‍රතිපත්ති සැලසුම් සහ මිනුම් දඬු සකස් කිරීමේදී එක්සත් රාජධානියේ ජාතික වෘත්තීය මාගෝ්පදේශ ප්‍රතිපත්තියට අදාළ කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම.

2. අනුව ඒ ඒ විෂයන්ට අදාළ තොරතුරු, වෘත්තීය මාගෝ්පදේශට  දැන්වීම් පුවරු, පෝස්ටර්, බැනර් පත්‍රිකා මඟින් පාසල තුල ප්‍රදරශනය කරන ලෙස ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්  දැනුවත් කිරීම.

3. විවිධ විෂයන්ට අදාළව වෘත්තීන්/ විශ්ව විද්‍යාල පාඨමාලා සහ වෘත්තීය පාඨමාලා පිළිබඳ තොරතුරු උගන්වන විෂයන් තුළට අන්තර්ගත කර සිසුන්ට ලබා දීමට කටයුතු කිරීමට විෂය භාර ගුරුවරුන් යොමු කරවීම.

4. සෑම සිසුවෙකුටම මනෝමිතික වෘත්තීය පරීක්ෂණයකට යොමු කරවීම තුළින් ඔහුට සිය හැකියා ලැදියා හඳුනා ගැනීම සහ විෂය ධාරාවන් තෝරා ගැනීමට අවස්ථාව සලසා දීම.

5. පාසල් වෘත්තීය මාර්ගෝපදේශ කමිටුවක් මඟින් 8 – 13 ශ්‍රේණි දක්වා සිසුන් සඳහා විවිධ වැඩසටහන්  ක්‍රියාත්මක කිරීම.




සමාරම්භක වැඩසටහන - Career Connect  - UK



වෘත්තීය මාර්ගෝපදේශක සමග සාකච්ඡා කිරීම  - Liverpool Collage



Liverpool Collage







**විෂයන්ට අදාළව වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු ප්‍රදර්ශනය**

















Liverpool Life Sciences University Technical College



City of Liver Pool College



Notre Dame Catholic College